# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/11 – 2022 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා – 2022.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාහිස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 978, ගලහ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගලහ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/DLT/2018/456 හා 2019.03.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – ගලහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0824ක් පමණ

උතුරට: මාර්ග (ප්‍රාදේශීය සභා), ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගලහවත්ත සහ මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) අඩිපාර සහ මාර්ග (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා).

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : LD/05/2004/PC/106.
2022 අගෝස්තු මස 22 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 - 0157

1A – G 37809 – 10 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*